# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1901/27 - 2015 පෙබරවාරි මස 13 වැනි සිකුරාදා - 2015.02.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 වැනි ව්‍යවස්ථාවේ (1) (අ) අනු ව්‍යවස්ථාව යටතේ පත්කරන ලද අමාත්‍යවරයන්ට පැවරෙන විෂයයන් හා කාර්යයන් සහ දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා 2015 පෙබරවාරි මස 10 වැනි දින සිට පහත උපලේඛනය සඳහන් වන පරිදි ක්‍රියාත්මක විය යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 45 (1) (ආ) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව ම විසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2015 පෙබරවාරි මස 12 වන දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලය.

**උපලේඛනය**

(1) ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය

| I වැනි තීරුව | II වැනි තීරුව | III වැනි තීරුව |
|---|---|---|
| *කාර්යයන් හා කර්තව්‍යයන්* | *දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *ක්‍රියාත්මක කළ යුතු නීති* |
| 1. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම | 1. ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය | * ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලය පනත (2008 අංක 05) |
| 2. III වැනි තීරුවෙහි දැක්වෙන පනත් ක්‍රියාත්මක කිරීම | 2. රණවිරු සේවා අධිකාරිය | * රණවිරු සේවා අධිකාරිය පනත (1999 අංක 54) |
| | 3. ආරක්ෂක සේවා පාසල | |
| | 4. ජාතික ශිෂ්‍යභට බලකාය | |

02 - 851

1A - G 21004 — 360 (2015/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*